**ආරක්ෂක අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා ගුවන් හමුදාව

## ලංසු ආරාධනය (IFB)

### ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ AN-32B ගුවන් යානා සඳහා එන්ජිමේ සංචිත හුවමාරු (POOL EXCHANGE) කිරීම

1. සභාපති, ආරක්ෂක අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC) විසින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ පිහිටි ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ **AN-32B** ගුවන් යානා සඳහා එන්ජිමේ සංචිත හුවමාරු **(POOL EXCHANGE)** කිරීම" සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි සිටින සුදුසුකම් ලත් හා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී. ප්‍රසම්පාදනයේ විස්තර පහත පරිදි වේ.

| අනු අංක | ප්‍රසම්පාදන හැඳුනුම් අංකය | විස්තරය | ලංසු සුරක්ෂණය වටිනාකම හා කාල සීමාව | ලංසු ලේඛන නිකුත් කිරීමේ අවසන් දිනය | නැවත නොගෙවන ගාස්තුව (රු.) | ලංසු භාරගැනීම අවසන් වන/විවෘත කිරීමේ දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|---|
| 01. | AHQ/23/FP/ANT/ 1001 | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ AN-32B ගුවන් යානා සඳහා එන්ජිමේ සංචිත හුවමාරුව (S/NO H29745Д001) | 2025 මාර්තු 04 රු.5,940,000.00 | 2024 නොවැම්බර් 04 | 60,000.00 | 2024 නොවැම්බර් 05 1100 පැය |
| 02. | AHQ/23/FP/ANT/ 1002 | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ AN-32B ගුවන් යානය සඳහා කොටස් අංක АИ 20Д , 5 ශ්‍රේණියේ එන්ජිමේ (S/NO H29115Д062) කොටසේ සංචිත හුවමාරුව | 2025 මාර්තු 04 රු.5,940,000.00 | 2024 නොවැම්බර් 04 | 60,000.00 | 2024 නොවැම්බර් 05 1330 පැය |
| 03. | AHQ/24/FP/ANT/ 1001 | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ AN-32B ගුවන් යානා සඳහා එන්ජිමේ සංචිත හුවමාරුව (S/NO H20545D006P1) | 2025 මාර්තු 04 රු.5,940,000.00 | 2024 නොවැම්බර් 04 | 60,000.00 | 2024 නොවැම්බර් 05 1200 පැය |

2. ලංසු කැඳවීම **ජාත්‍යන්තර තරගකාරීත්ව ලංසු (ICB)** ක්‍රමය අනුව සිදු කෙරෙනු ඇත.

3. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත 1 ඡේදයේ සඳහන් එක් එක් ප්‍රසම්පාදනය වෙනුවෙන් දක්වා ඇති නැවත නොගෙවනු ලබන ගාස්තුව ගෙවා **2024 සැප්තැම්බර් 23 දින** සිට 1 ඡේදයේ දක්වා ඇති දිනවල ප්‍රධාන මූල්‍ය නිලධාරි 1 , ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලේඛන කට්ටලය මිල දී ගත හැකි අතර **සෑම වැඩ කරන දිනකම පැය 0900 සිට 1500 දක්වා ප්‍රසම්පාදන අංශය, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ** (දුරකථන: +94112390719, ෆැක්ස් - +94112390720, E-Mail - **procurement@defence.lk** ) වෙතින් ගාස්තු රහිතව ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය. නැවත ගෙවනු නොලබන ගාස්තුව ගෙවිය යුතු වන්නේ මුදලිනි. ලංසුව **2025 පෙබරවාරි 04 දින** වන තෙක් වලංගු විය යුතු ය.

4. සම්පූර්ණ කරන ලද ලංසු යෝජනාව ටෙන්ඩර් හැඳුනුම් අංකය සලකුණු කර, 1 ඡේදයේ දක්වා ඇති දිනය හා වේලාවට හෝ ඉන් පෙර පහත ලිපිනයට කූරියර් මාර්ගයෙන් එවීමට/භාරදීමට කටයුතු කළ යුතු අතර ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම, සහභාගී වීමට අපේක්ෂා කරන ලංසුකරුවා/ලංසුකරුවාගේ නියෝජිතයින් ඉදිරියේ ඉහත අංක 01 ඡේදයේ දක්වා ඇති දිනය හා වේලාවේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු භාරගැනීමේ වේලාව ඉකුත් වීමෙන් පසුව කිසිදු ලංසුකරුවෙකුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට ලංසු විවෘත කිරීම සඳහා සහභාගී වීමට අවසර නොලැබේ.

   ප්‍රසම්පාදන ශාඛාව
   2 වන මහල, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
   ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ,
   ශ්‍රී ලංකාව

5. සියලුම ලංසුකරුවන් ඉහත අංක 1 වන ඡේදයේ සඳහන් කර ඇති වටිනාකම සහ කාලසීමාව සඳහා පළමු ලිඛිත ඉල්ලුම මත මුදල් කළ හැකි සහ කොන්දේසි විරහිත ලංසු බැඳුම්කරයක් මගින් ලංසු ඇපයක් ඉදිරිපත් කළ යුතු ය. ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකාවේ පිළිගත් බැංකු-වක් තුළින්, ලබාගත යුතු අතර එම සුරක්ෂණය **"ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්"** වෙත යොමු කළ යුතු ය. ලංසු සුරක්ෂණයේ නියැදි පිටපතක් රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශය - 2006 හි ඇත.

6. වැඩි දුර තොරතුරු සඳහා ලංසුකරුවන්ට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නිලධාරියා සමග සම්බන්ධ විය හැකිය.

   ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී
   ප්‍රසම්පාදන අංශය
   LL2 මහල, ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය,
   තැ.පෙ. 594, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
   ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
   දුරකථනය - +94112347694, +94112441044 (දිගුව 11902)
   ෆැක්ස් - +94112441553,
   ඊමේල් - cpd@slaf.gov.lk, acpot@slaf.gov.lk

SELACINE

**ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය,**
**තැ.පෙ. 594, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

**ගුවන් හමුදාධිපති**